# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No – 10120

ෆැක්ස් / தொலைநகல / Fax – 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone – 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site – www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail – dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO – 627 / 2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No – / 2024

දිනය / திக / Date – 11/04/2024 පැය 2015

## මාධ්‍ය නිවේදනය

**නීති විරෝධී ලෙස මෙරටට රැගෙන එන ලද දුම්වැටි, විදේශීය මත්පැන්, ජංගම දුරකතන හා පරිගණක උපාංග සමඟ සැකකරුවන් තිදෙනෙකු අත්අඩංගුවට - අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තු ගුවන් තොටුපල ඒකකය.**

2024.04.11 වන අද දින දහවල් කාලයේදී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තු ගුවන්තොටුපල ඒකකයේ නිලධාරීන් විසින් ඉන්දියාව හා ඩුබායි රාජ්‍යයේ සිට ගුවන් මගින් මෙරටට පැමිණි සැකකරුවන් තිදෙනෙකු **තීරුබදු රහිතව රැගෙන එන ලද දුම්වැටි, විදේශීය මත්පැන්, ජංගම දුරකතන, ලැප්ටොප් පරිගණක යන්ත්‍ර, ටැබ් පරිගණක යන්ත්‍ර හා පරිගණක උපාංග රැසක්** සමඟ අත්අඩංගුවට ගෙන ඇත.

01 වන සැකකරු වයස අවුරුදු 48 ක් වන මස්කෙළිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වන අතර සැකකරු සන්තකයේ තිබී තීරුබදු රහිතව ඉන්දියාවේ සිට මෙරටට රැගෙන එන ලද විදේශීය මත්පැන් බෝතල් 111ක් හා දුම්වැටි කාටුන් 13ක් අත්අඩංගුවට ගෙන ඇත.

02 වන සැකකරු වයස අවුරුදු 46 ක් වන කොළඹ 13 ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වන අතර සැකකරු සන්තකයේ තිබී තීරුබදු රහිතව ඉන්දියාවේ සිට මෙරටට රැගෙන එන ලද දුම්වැටි කාටුන් 09ක් අත්අඩංගුවට ගෙන ඇත.

03 වන සැකකරු වයස අවුරුදු 69 ක් වන මිනුවන්ගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වන අතර සැකකරු සන්තකයේ තිබී ඩුබායි රාජ්‍යයේ සිට තීරුබදු රහිතව මෙරටට රැගෙන එන ලද ඇපල් වර්ගයේ ජංගම දුරකතන 06ක්, ඇපල් වර්ගයේ ටැබ් පරිගණක යන්ත්‍ර 10ක්, ඇපල් වර්ගයේ ලැප්ටොප් පරිගණක යන්ත්‍ර 06ක්, අත්ඔර්ලෝසු 19ක්, පරිගණක හා ජංගම දුරකතන උපාංග තොගයක් අත්අඩංගුවට ගෙන ඇත.

අත්අඩංගුවට ගත් සැකකරුවන් වැඩිදුර විමර්ශන සඳහා රේගු දෙපාර්තමේන්තුව වෙත භාර දීමට නියමිතව ඇත.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**